



# සිතන්නට යමක්.................

කැකුළු මල් පිදිච්ච

මේ පොළව රළු වෙලා

ඒ කැකුළු වනසමින්

කොන්ක්‍රීට් රජවෙලා

සුපිරිසිදු පවන් රැල්

නොමැති වී ගියපු ලොව

රථ වලින් පිට කරන

වායුවෙන් වැනසිලා

කටුකොහොල් පිරී ගිය

ජීවිතෙන් එක් දිනක්

නිදහසේ විඳින්නට

අද නොමැත වන පෙතක්

රුදුරු මිනිසුන් විසින්

කපා ඇත සෑම ගසක්

ලෙඩ වලින් තොර වෙන්න-නිදහස්ව විඳගන්න

නොපැකිලව අදම ඔබ-සිටුවන්න එක් ගසක්

**නිලූෂා මධුශානි**

**රාගම**